සිරිවර්ධන,- පී.පී.ජී.සී., දර්ශන අංශය
සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

*Paper: Diversity*

# ප්‍රකෝප කළමනාකරණය පිළිබඳ දාර්ශනික හා මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

'ප්‍රකෝප කළමනාකරණය', මනෝවිද්‍යාත්මකව සාකච්ඡාවට ලක්වී ඇති මාතෘකාවකි. ප්‍රකෝපය යන්න තරහව, ද්වේෂය, ක්‍රෝධය, කෝපය යනාදී වශයෙන් ද හඳුන්වා දිය හැකිය. ප්‍රකෝපය පිළිබඳව අධ්‍යයනය වැදගත් වනුයේ එය පෞද්ගලික හෝ සමාජයීය සුභසාධනය කෙරෙහි නිශේධනාත්මකව බලපෑ හැකි බැවිනි. ප්‍රකෝපය පිළිබඳව අතීතයේ සිට සිදු වූ සංවාද හේතුවෙන් එහි නෛසර්ගික අගයයන් පිළිබඳව පවතිනුයේ මතවාදීමය පසුබිමකි.

ප්‍රකෝපය සඳහා සදාචාරාත්මක පදනම බලපාන බව මෙහිදී හඳුනාගත හැකි මූලික කාරණයක් වන අතර කෝපය ඇතිවීමත් සමඟ ඇති වන කායික හා මානසික රෝග ගණනාවක් ඇති බව මෙහිලා සඳහන් කළ හැකිය. අක්‍රීය ප්‍රකෝප අවස්ථාවේදී මිත්‍රශීලී බවක් නොපෙන්වීම, ව්‍යාජ සිනහව, නොසැලකිලිමත් බව, දෙගිඩියාව, අධික ලෙස ආහාර ගැනීම, අධික නින්ද, නිර්මදතාව හෙවත් ලිංගික ආශාවන් කෙරෙහි උදාසීන බවක් දැක්වීම, මඟහැරයාම, ප්‍රතිඵල රහිත කාර්යයන්හි යෙදීම, මැඩ පවත්වා ගත නොහැකි ග්‍රස්තියෙන් යුත් චර්යාව හෙවත් අසීමාන්තික පිරිසිදු බව සහ පිළිවෙළ, නිහඬ චර්යාව හෙවත් නුරුස්නා ගතිය, පාවාදීම, තමාට ම දොස් පවරා ගැනීම වැනි ව්‍යාබාධ ඇති වන බව හඳුනාගන්නා ලදී. ප්‍රචණ්ඩකාරී ප්‍රකෝප අවස්ථාවේ දී තර්ජනය කිරීම, බිය ගැන්වීම, විනාශකාරී බව, කායික හා වාචික වශයෙන් ප්‍රචණ්ඩත්වය දැක්වීම, දඬුවම් කිරීම, උන්මාද චර්යාවන්, ආත්මාර්ථකාමිත්වය, පළිගැනීම යනාදිය සිදුකරයි.

මෙහිදී ප්‍රකෝපය කළමනාකරණය කිරීම සඳහා වන උපක්‍රම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී ප්‍රාථමික හා ද්විතියික වශයෙන් දත්ත එක්රැස් කරන ලද අතර, එමගින් ප්‍රකෝපය සඳහා බලපානු ලබන ඍජු හා වක්‍ර හේතු සාධක සොයාබැලීමත් ඒවා මඟහරවා ගැනීමේ ක්‍රමවේද සොයා බැලීමත් අරමුණු විය. ප්‍රකෝපය පාලනය කිරීමේ දී ඒ සඳහා පුද්ගලයින් අතර එකඟත්වයකට එළඹීම, ගැඹුරු ආශ්වාස ප්‍රාශ්වාසය, භාවනා කිරීම වැනි ආතතිය කළමනාකරණ ක්‍රමෝපායන් හඳුනාගැනීම මෙන්ම නිපුනතා වර්ධනය, සමාවදීම, කථා විලාශය වෙනස් කිරීම, සර්වශුභවාදී හැඟීම් ඇති කිරීම, ආකල්ප වෙනස් කිරීම ආදී උපක්‍රම වැදගත් වේ. පුද්ගලයාගෙන් පුද්ගලයාට ප්‍රකෝපය සාපේක්ෂ වන බැවින්, ඒ සඳහා විසඳුම් සෙවීම සඳහා ඒ ඒ පුද්ගලයාගේ ජීවන අනුභූතීන් පිළිබඳ සැලකිලිමත් විය යුතු බව හඳුනාගන්නා ලදී. ඒ අනුව, ප්‍රකෝපය කළමනාකරණය කිරීම සඳහා වන ඉහත ආකාරයේ ක්‍රමවේද ගණනාවක් හඳුනාගැනීම මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කෙරේ.

**මුඛ්‍ය පද : ප්‍රකෝපය, කළමනාකරණය, සදාචාරය, ප්‍රචණ්ඩත්වය**